වත්මන් රජයේ විදුලිබල සංවර්ධන වැඩසටහන සහ එහි ආයෝජන

01. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මෑත කාලයේ ආර්ථික වර්ධන වේගය 6% - 7% අතර ප්‍රමාණයකින් වර්ධනය වී ඇත. මෙවැනි ආර්ථික වර්ධනයක් කරා ළඟා වීමේදී රටේ ප්‍රධාන යටිතල පහසුකම් අතරින් මූලික අංශයක් වන විදුලිබල අංශයේ දායකත්වය වැදගත් තැනක් උසුලයි. ආර්ථික වර්ධනය හේතු කොට ගෙන බලශක්තිය සඳහා ඇති ඉල්ලුම ද මේ වන විට වැඩි වී ඇත.

රටේ සමස්ථ ජනතාව සඳහා දැරිය හැකි මිලකට පරිසර හිතකාමී අයුරින් විශ්වාසනීය හා චිරස්ථායී විදුලිබල සැපයුමක් ලබා දීම විදුලිබල ක්ෂේත්‍රයේ දිගුකාලීන දර්ශනය වේ. අඩු ආර්ථික පිරිවැයක් යටතේ දිගුකාලීන හා අඛණ්ඩ ලෙස ජනතාවගේ මූලික අවශ්‍යතා හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ආර්ථික කටයුතු වල නියැලීමට අවස්ථාව සලසා දීම බලශක්ති අවශ්‍යතා සපුරාලීම මගින් සිදු කල යුතුය. 2000 වර්ෂය වන විට රටේ සමස්ත කුටුම්භයන්ගෙන් විදුලිබලය සැපයීමට හැකිවී ඇත්තේ 57% කට පමණි. මෙය 2008 වසර අවසානය වනවිට 82% දක්වා ඉහළ ගොස් ඇත. දැනට නාගරික ප්‍රදේශ වල විදුලිබල පහසුකම් ලබාගැනීම සඳහා අවකාශ ඇත්තේ සමස්ත නාගරික කුටුම්භයන්ගෙන් 80% - 85% ක් අතර ප්‍රමාණයකට වේ. එය ග්‍රාමීය ප්‍රදේශ වලදී 50% - 60% ත් අතර ප්‍රමාණයක් වේ. වගු අංක 1 මගින් මෙය වඩාත් හොඳින් නිරූපණය වේ. ජාතික විදුලිබල පද්ධතිය යොදා ගනිමින් විදුලිය සැපයිය හැක්කේ රටේ සමස්ත කුටුම්භයන්ගෙන් 90%කට පමණි. ඉතිරි අය සඳහා විදුලිය සැපයීම ජාතික විදුලිබල ජාලයෙන් පරිබාහිර පුනර්ජනනීය විදුලිබල ප්‍රභවයන් වන කුඩා ජල විදුලි බලාගාර, සූර්ය බලය හා සුළං මගින් ක්‍රියාත්මක වන විදුලි බලාගාර මගින් සිදු කල හැකිය.

වගුව 01 : පළාත් හා දිස්ත්‍රික්ක අනුව විදුලිබල සැපයුම - 2007

පළාත	දිස්ත්‍රික්කය	විදුලිබල පහසුකම් කුටුම්භයන් සංඛ්‍යාව % ලෙස
මධ්‍යම	මහනුවර	79
	මාතලේ	84
	නුවරඑළිය	86
උතුරු මැද	අනුරාධපුර	71
	පොළොන්නරුව	69
වයඹ	කුරුණෑගල	76
	පුත්තලම	83
බස්නාහිර	කොළඹ	98
	ගම්පහ	98
	කළුතර	83
නැගෙනහිර	අම්පාර	67
	මඩකලපුව	54
	ත්‍රිකුණාමලය	56
දකුණ	ගාල්ල	97
	මාතර	94
	හම්බන්තොට	80
උතුර	වව්නියාව	62
	කිලිනොච්චිය	4
	යාපනය	60

	මන්නාරම මුලතිව්	37 1
ඌව	බදුල්ල මොණරාගල	67 50
සබරගමුව	රත්නපුරය කෑගල්ල	70 79

මූලාශ්‍රය : විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

පාරිභෝගිකයාට විදුලිය ලබා දෙන ප්‍රධාන රජය ආයතනය වන්නේ ලංකා විදුලිබල මණ්ඩලයයි (ලංවිම). පාරිභෝගිකයා වෙත විදුලිය ලබා දීමේ ප්‍රධාන ක්‍රියාවලීන් තුනක් ක්‍රියාත්මක වේ. එනම්, විදුලිබලය උත්පාදනය හෙවත් ජනනය, සම්ප්‍රේෂණය හා බෙදා හැරීමයි. විදුලිබල ජනනය යනු ඉන්ධන, ජලබලය හෝ වෙනත් විකල්ප බලශක්තීන් යොදාගෙන විදුලිබලය නිෂ්පාදනය කිරීමයි. නිපදවනු ලබන විදුලිබලය අධිබල රැහැන් ඔස්සේ ග්‍රිඩ් උපපොල කරා ගෙන යාම සම්ප්‍රේෂණය වශයෙන් හැඳින්වේ. ග්‍රිඩ් උප පොළේ සිට අඩු ධාරිතාවයකින් යුත් රැහැන් ඔස්සේ පාරිභෝගිකයාට විදුලිය සැපයීම බෙදා හැරීම වශයෙන් හඳුන්වනු ලැබේ. මෙම තෙවැදෑරුම් ක්‍රියාවලිය ඉටු කිරීමේ ප්‍රධාන ආයතනය ලං.වි.ම. වේ. මෙරට විදුලිබල උත්පාදනයෙන් 76% ක් ලං.වි.ම. මගින් සිදු කරනු ලබන අතර 24% පෞද්ගලික සමාගම් මගින් සිදු කරනු ලබයි. 2007 වර්ෂයේ දී විදුලිබල ජනනය ගෙගාවෝට් පැය 9,814ක් වූ අතර 2016 වන විට එය ගෙගාවොට් පැය 19,066 දක්වා වර්ධනය කල යුතු වේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ විදුලිබල උත්පාදනය ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් මත රඳා පවතින අතර එම නිසා විදුලිබල නිෂ්පාදනය කිරීමට වැය වන වියදම ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වය මඟ හැර ගැනීමට හැකි වන්නේ ගල් අඟුරු, ජල විදුලිබලය වැනි අඩු වියදම් සහිත ඉන්ධන ප්‍රභවයන් විදුලිබලය උත්පාදනය සඳහා යොදා ගැනීමෙනි.

02. ප්‍රධාන උපාය මාර්ග

දැනට අප රටෙහි වාර්ෂික විදුලිබල ඉල්ලුම දළ වශයෙන් 7% - 8%ත් අතර අගයකින් වැඩි වන අතර එම නිසා වසරකට මෙගාවොට් 200ක පමණ විදුලි ධාරිතාවයක් වැඩි වන ඉල්ලුම සපුරාලීමට ජාතික විදුලිබල පද්ධතියට එක් කල යුතුය. මෙම අභියෝගය ජය ගැනීම සඳහා රජය විසින් ප්‍රධාන උපාය මාර්ග කිහිපයක් හඳුනා ගෙන ඇත. අඩු පිරිවැය යටතේ විදුලිය උත්පාදනය කිරීම ප්‍රසාරණය කිරීමේ සැලසුම් සකස් කිරීම, ගල් අඟුරු විදුලි බලාගාර ඉදි කිරීම, ඉතිරි මධ්‍යම පරිමාණ ජල විදුලි බලාගාර ඉදි කිරීම, ජාතික විදුලිබල පද්ධතියේ බෙදා හැරීමේ කටයුතු පුළුල් කිරීම සඳහා ආයෝජනය කිරීම, පවතින විදුලි බලාගාර පුනරුත්ථාපනය කිරීම, ගුණාත්මක හා විශ්වාසනීය විදුලිබල සේවාවක් ලබා දීම සඳහා සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය කිරීම, පවතින සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ ජාලයේ වැඩි වශයෙන් පද්ධති හානි සිදුවන කොටස් සඳහා එම හානි අවම කිරීමට කටයුතු කිරීම. පුනර්ජනනීය විදුලිබල නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික හා මූල්‍ය ආධාර ලබා දීම හා කාර්යක්ෂම බලශක්ති භාවිත කිරීමේ ක්‍රම හඳුන්වා දීම, විදුලි උපකරණ වල අනිවාර්ය ලේබල් කිරීම හඳුන්වා දීම, බලශක්ති සංරක්ෂණය සඳහා පුද්ගලික හා රාජ්‍ය අංශයේ ධාරිතාව වැඩිදියුණු කිරීම හා සංයුක්ත ප්‍රතිදීප්ත පහන් ජනප්‍රිය කිරීමේ වැඩසටහන් හඳුන්වා දීම වැනි උපායමාර්ග මේ අතර ප්‍රධාන තැනක් ගනී. එසේම රන්දොර යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ඉහළ කොත්මලේ ජලවිදුලි බලාගාරය, කෙරවලපිටිය විදුලි බලාගාරය, නොරොච්චෝල ගල් අඟුරු විදුලි බලාගාරය වැනි මහා පරිමාණ විදුලිබල සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කර ඉදිකර හා ඉදිකරමින් පවතින්නේ වාර්ෂිකව ඇති වන අධික විදුලිබල ඉල්ලුම සපුරාලීමටය.

03. විදුලිබල ඉල්ලුම සපුරාලීම සඳහා රජය දැනට ගෙන ඇති ප්‍රධාන ක්‍රියාමාර්ග

උත්පාදනය

- ජාතික විදුලිබල පද්ධතියට වාර්ෂිකව මෙගා වොට් පැය 409ක්එකතු කිරීමට සමත් මෙගාවොට් 150 ක ධාරිතාවයක් සහිත ඉහළ කොත්මලේ ජලවිදුලිබල ව්‍යාපෘතිය ආරම්භ කිරීම.

- ලක්ෂපාන, විමලසුරේන්ද්‍ර හා උකුවෙල ජල විදුලි බලාගාර ප්‍රතිසංස්කරණ කටයුතු වලින් පසු මෙගාවොට් 215ක විදුලිබල උත්පාදනයක් වාර්ෂිකව ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීම.

- නොරොච්චෝලේ පිහිටි ගල් අඟුරු විදුලි බලාගාරය මගින් මෙගාවොට් 500ක විදුලිබල ධාරිතාවයක් අළුතින් වාර්ෂිකව එක් කිරීම.

- ත්‍රිකුණාමලය ගල්අඟුරු විදුලි බලාගාරය තුලින් මෙගාවොට් 1000 ක විදුලි බලයක් අදියර 2ක් යටතේ ජනනය කිරීම.

- කෙරවලපිටිය විදුලිය බලාගාරය මගින් දැනටමත් අලුතින් මෙගාවොට් 270 ක විදුලි ධාරිතාවයක් අළුතින් විදුලි ජනනයට එක්කොට ඇත.

- බෝඩ්ලන්ඩ් ජලවිදුලි ව්‍යාපෘතිය, මොරගොල්ල ජලවිදුලිබල ව්‍යාපෘතිය, උමා ඔය ජලවිදුලි ව්‍යාපෘතිය, ගිං ගඟ ජල විදුලි ව්‍යාපෘතිය, තාප විදුලි බලාගාර සඳහා ස්වභාවික වායුව හඳුන්වා දීම වැනි ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

සම්ප්‍රේෂණය

විදුලිබල සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය කිරීම මගින් විදුලිය බෙදා හැරීමේ තත්ත්වය සහ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීමටත්, සම්ප්‍රේෂණ ජාල පහසුකම් අවශ්‍ය තරම් සැපයීමට සහ විදුලිය අපතේ යාම් අවම කිරීමටත් හැකියාව ලැබෙනු ඇත. රජය විසින් සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය කිරීම සඳහා පහත දැකවෙන ව්‍යාපෘතීන් කඩිනමින් ක්‍රියාත්මක කරමින් සිටී.

- කෙරවලපිටිය - කොටුගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය
- මහ කොළඹ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය
- නව ගාලු සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය
- වවුනියාව - කිලිනොච්චිය සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය
- විදුලිබල අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය
- මාතර - ගාල්ල 132 කි.වො. සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම
- උප ග්‍රිඩ් මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම
- කිලිනොච්චිය - චුන්නාකම් සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම
- උතුරු - නැගෙනහිර සම්ප්‍රේෂණ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
- පිවිතුරු බලශක්ති ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම
- හබරණ - වාලච්චේන කි.වො. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම
- නව පද්ධති පාලක මධ්‍යස්ථානය ශ්‍රී ජයවර්ධනපුර ඉදි කිරීම

මීට අමතරව ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සම්ප්‍රේෂණ සම්බන්ධතාවයක් සඳහා සැලසුම් සැකසීම කලක සිට අවධානයට ලක් වී තිබේ. අවම පිරිවැයක් යටතේ ඉන්දියාවෙන් විදුලිය ලබාගැනීම සහ ශ්‍රී ලංකාවේ අනාගතයේ දී අතිරික්ත විදුලිබලයක් ඇති වුවහොත් ඉන්දියාවට සැපයීම සඳහා සම්ප්‍රේෂණ මාර්ගයක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදුවෙමින් පවතී.

බෙදා හැරීම

විදුලිබලය බෙදා හැරීමේ දී ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම මගින් ග්‍රාමීය ප්‍රදේශ වලට විදුලි බලය සැපයීම විදුලිබල අංශයේ ප්‍රධාන තැනක් ගනී. මෙයට ප්‍රධාන හේතුව වනුයේ එමගින් ග්‍රාමීය ප්‍රදේශ වලට ඉහළ සමාජ ආර්ථික ප්‍රතිලාභ සැලසෙන බැවිනි. පසුගිය කාලය තුලදී ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම 5000කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ඇත. විදුලිබලය බෙදා හැරීමේ අංශයේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. ප්‍රධාන ව්‍යාපෘති පහත දැක්වේ.

- කොළඹ නගරයේ විදුලිය බෙදා හැරීමේ ව්‍යාපෘතිය
- ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය පියවර 4 සහ 6
- විදුලිබල අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය - B කොටස

හම්බන්තොට, රත්නපුර, කෑගල්ල, අනුරාධපුරය, මහනුවර, පොළොන්නරුව, මොණරාගල සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක සඳහා මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් ප්‍රකාශ කර ඇති පරිදි " විදුලමු ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ විදුලිබලය ලබා දී ඇත.

සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ ජාලයේ සිදුවන හානි විදුලිබල ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ගැටළුවකි. විදුලිබල නිෂ්පාදනයේ අධික වියදමට මෙය සෘජු ලෙස බලපායි. ලං.වි.ම. සතු මුළු සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ ජාලයේ සිදුවන සම්පූර්ණ හානිය ශුද්ධ විදුලිබල නිෂ්පාදනයෙන් 16%ක් පමණ වේ. රජයේ දස අවුරුදු සංවර්ධන රාමුවට අනුව පද්ධති හානිය 2010 වන විට 12% දක්වා අඩු කිරිමට බලාපොරොත්තු වේ. මෙවැනි ඉලක්කයක් ළඟා කර ගැනීම සඳහා ජාල අධ්‍යයනය වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලද අතර මධ්‍යම වෝල්ටීය බෙදා හැරීමේ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. බොහෝ මධ්‍යම වෝල්ටීයතා අධිවේගී මාර්ග, මධ්‍යම වෝල්ටීයතා මාර්ග ප්‍රතිසන්නායක සහිතව බෙදා හැරීමේ ග්‍රන්ට් රටේ ප්‍රාථමික උපපොළ සංවර්ධන වැඩකටයුතු වලට අනුව සකස් කිරිම සඳහා සැලසුම් කර තිබේ. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ අනාගත ධාරා වර්ධනයට පහසුකම් සලසනුවස් පවත්නා ජාලයේ විදුලිබල හානි හා වෝල්ටීයතා අඩුවීම පිළිගත හැකි මට්ටමකට අඩු කිරීමයි.

වත්මන් ලෝකයේ මිනිසා මුහුණ දෙන ප්‍රධානතම ප්‍රශ්ණයක් වනුයේ බලශක්ති අර්බුදයයි. එයට මුහුණ දීම සඳහා විවිධ විකල්පයන් කෙරෙහි යොමු වීම ඉතා වැදගත් වේ. මෙම අභියෝගය ජය ගැනීම සඳහා රජය විසින් සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවන ලද අතර එය පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයේ ඉතා වැදගත් පියවරකි. සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් පසුගිය කාලය තුලදී විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සිදු කරන ලදී. මෙමගින් බලශක්ති ප්‍රතිපත්ති, සංවර්ධනය සැලසුම්, සම්පත් සංවර්ධන වැඩසටහන්, බලශක්ති කාර්යක්ෂම භාවිතය වර්ධනය කිරීමේ වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩ සටහන් හා තාක්ෂණික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. රජය මෙවැනි ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මගින් බලාපොරොත්තු වන්නේ කාර්යක්ෂම හා විශ්වාසනීය විදුලිබල සැපයුමක් ලබාදීමත්, වර්ෂ 2016 වන විට රටේ සමස්ථ කුටුම්භ සංඛ්‍යාවෙන් 95% කට විදුලිය ලබාදීමත්, ආර්ථික සංවර්ධන ඉලක්ක ජය ගැනීම සඳහා වන ප්‍රධාන යටිතල පහසුකම් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමත්ය.

පහත දැක්වෙන වගුව නිරීක්ෂණය කිරීමෙන් විදුලිබල අංශය සඳහා රජය දැනට සිදුකර ඇති ආයෝජනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට හැකි වේ.

වගුව 2 : විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රාජ්‍ය ආයෝජනය

රු. මිලියන

	2005	2006	2007	2008	2009	2010 පුරෝකථන
විදුලිබල උත්පාදනය	567	1506	18,641	12,789	23,890	62,754
බෙදාහැරිම	328	2,050	1,569	4,128	3,912	3,270
සම්ප්‍රේෂණය	1,028	928	514	5,961	7,728	16,327
එකතුව	**1,923**	**4,484**	**20,724**	**22,878**	**35,530**	**82,351**

මූලාශ්‍ර : රාජ්‍ය ආයෝජන වැඩසටහන - 2008-2011
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සහ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට නම් තරගකාරී මිල පරාසයක් තුල විශ්වාසදායක හා ප්‍රමාණවත් බලශක්ති සැපයුමක් තිබිය යුතුය. එබැවින් බලශක්ති අංශය සංවර්ධනය, සෘජුවම ආර්ථික සංවර්ධනයට බලපාන බව පැහැදිලිය. ඒ අනුව ප්‍රමාණවත් හා ක්‍රමාණුකූල බලශක්ති සැපයුමක් පැවතීම රටක ආර්ථික වර්ධනයට උපකාරි වන බව රජය පැහැදිලිවම අවබෝධ කර ගෙන තිබේ.

විදුලිබල හා බලශක්ති අංශය
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව